පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE


ශ්‍රේණිය

07

# අවසාන වාර පරීක්ෂණය - 2023

## ඉතිහාසය I , II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය ; පැය 02 යි.

## I කොටස

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

01. අතීතයේ පැවති හේන් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ,

(1) සෙහෙන් (2) සේන් (3) පිටබිම්

02. මහා විජයබාහු රජතුමා ගැන හැදෑරීමට වැදගත් නොවන මූලාශ්‍රයකි,

(1) මහාවංසය (2) පනාකඩුව තඹ සන්නස (3) සංගමු විහාර ලිපිය

03. ළමා කාලයේ දොරමඩලාව නම් ගමේ ජීවත් වූ බව සඳහන් වන රජතුමා කවරෙක්ද?

(1) මහසෙන් (2) පණ්ඩුකාභය (3) මහා පරාක්‍රමබාහු

04. මිණිපේ ගංදෙණිය පර්වතයේ බලකොටුවක් පිහිටුවාගෙන සිටි සෙනවියා කවුරුන්ද?

(1) සංඛ (2) සුභ (3) බුවනෙකබාහු

05. ' බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ' වශයෙන් සැලකෙන ග්‍රීක ජාතිකයා කවරෙක්ද?

(1) සොක්‍රටීස් (2) ඇරිස්ටෝටල් (3) හිපොක්‍රටීස්

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති වල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වරහනින් තෝරා ලියන්න.**

06. තෝනිගල සෙල්ලිපියේ මහ කන්නය හඳුන්වා ඇත්තේ ........................................................... නමිනි. (අකලහස/පිටදඩහස)
07. යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා ........................................................... නම් වේ. (විජයකුලංගෛ/සංකිලි)
08. රෝම අධිරාජ්‍යයට අයත්ව පැවති ජෙරුසෙලම අසල බෙත්ලෙහෙමේදී ....................................................... උත්පත්තිය සිදුවී තිබේ. (ජේසුතුමාගේ/ මහම්මත්තුමාගේ)
09. උඩරට ප්‍රාදේශීය පාලකයෙකු වූ ජෝතිය සිටාණන්ගේ කැරැල්ල ................................................... කුමරු විසින් මැඩපවත්වන ලදි. (අම්බුලුගල/සපුමල්)
10. නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා විසින් ................................................. බලකොටුව ඉදිකරවන ලදි. (කෝට්ටේ/යාපනය)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් 'V' ලකුණ ද වැරදි නම් 'X' ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. 'ශ්‍රී මාර ශ්‍රී වල්ලභ'නම් පාණ්ඩ්‍ය රජු මෙරට ආක්‍රමණයක් කලේ දෙවන සේන රජුගේ කාලයේදී ය. (    )
12. 'අන්තානි කණු'යනු රාජ්‍ය දීමනා පිළිබඳ සඳහන් ශිලා ලිපි විශේෂයකි. (    )
13. 'කංචි පුරය'පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර විය. (    )
14. I වන පරාක්‍රමබාහු රජු විසින් නගරගිරි කිත්ති නම් සෙනවියාට දුන් ත්‍යාග පිළිබඳව දෙවනගල සෙල්ලිපියේ සඳහන් වේ. (    )
15. ඉතාලිය යුරෝපයේ සෙසු රටවලින් වෙන් වන්නේ ඇපිනයින් කඳු වැටියෙනි. (    )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති 'A' සහ 'B' තීරු ගැලපෙන අයුරින් යා කරන්න.**

| 'A' | | 'B' |
|---|---|---|
| 16. පැන්තියන් දේවස්ථානය. | (    ) | A. අම්බලන්ගොඩ |
| 17. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය. | (    ) | B. රෝමය |
| 18. වෙස්මුහුණු | (    ) | C. ග්‍රීසිය. |
| 19. විද්‍යාරම්භ | (    ) | D. පාකිස්ථානය |
| 20. මොහෙන්දජාරෝ. | (    ) | E. අධ්‍යාපනය ඇරඹීම |

(20×2 =40)

**II කොටස**

❖ **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**

❖ **ප්‍රශ්න අංක 02 සිට 07 දක්වා ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න 04 ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

01.

1. 

**A**

(i) A ඡායාරූපයෙන් දැක්වෙන ඓතිහාසික ගොඩනැගිල්ල අයත් රාජධානිය කුමක්ද?

....................................................................................................

(ii) එය කරවන ලද රජතුමා කවරෙක් ද?

....................................................................................................

(iii) එතුමා විසින් කරන ලද ශාසනික සේවා සඳහා උදාහරණ 02 ක් ලියන්න.

....................................................................................................

....................................................................................................

(ලකුණු 04)

2. 

**B**

(i) B රූපයෙන් දැක්වෙන්නේ මොනවාද?

....................................................................................................

(ii) ඒවා අයත් කර්මාන්තය කුමක්ද?

....................................................................................................

(iii) මෙම කර්මාන්තයේ දක්නට ලැබෙන වෙනත් භාණ්ඩ වර්ග 02ක් ලියන්න.

....................................................................................................

....................................................................................................

(ලකුණු 04)

3. 

C

(i) C ඡායාරූපයෙන් දැක්වෙන ප්‍රතිමාව කුමක්ද?

....................................................................................................

(ii) මෙම ප්‍රතිමාව අයත් ශිෂ්ටාචාරය කුමක්ද?

....................................................................................................

(ii) මෙම නිර්මාණය කිරීමට යොදාගත් දුර්ලභ ද්‍රව්‍ය 02 ක් ලියන්න.

........................................................................................................................................ (ලකුණු 04)

02. (i) අතීත කුඹුරු ගොවිතැනේ දී යොදාගත් උපකරණ 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වී ගොවියා ගොයම ආරක්ෂා කරගැනීමට අතීතයේ භාවිතා කළ ස්වාභාවික ක්‍රම 02 ක් ලියන්න. (ලකුණු 04)

(iii) හේන් වගාවේ දී හේන ආරක්ෂා කර ගැනීමට ගොවීහු අනුගමනය කල ක්‍රම පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

03. (i) අතීතයේදී අපේ රජවරු විදේශ වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අප රටට විදේශ රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ වර්ග 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) බදුලු ටැම් ලිපියට අනුව රටතුල වෙළදාම පවත්වාගෙන යාමේ දී පනවා තිබූ නීති රීති පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

04. (i) පහත සඳහන් රාජ්‍යයන්හි අගනුවරවල් නම් කරන්න.

A - පල්ලව රාජ්‍යය

B - පාණ්ඩ්‍ය රාජ්‍යය

C – චෝල රාජ්‍යය (ලකුණු 03)

(ii) I විජයබාහු රජතුමා විදේශයන්ගෙන් එල්ල වන බලපෑම් වලක්වා ගැනීමට ගත් ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ලකුණු 04)

(iii) I විජයබාහු රජතුමාගෙන් අපට ගත හැකි ආදර්ශ පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

05. (i) රජරට ශිෂ්ටාචාර සමයේ දී ජනතාව එක්රැස් වී පැවැත්වූ උත්සව 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු නිරිතදිග ප්‍රදේශයේ ව්‍යාප්ත වූ රාජධානි 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) II පරාක්‍රමබාහු රජු රට සතුරන්ගෙන් ආරක්ෂා කරගැනීමට ක්‍රියාකළ ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

06. (i) අග්‍රගණ්‍ය ග්‍රීක දාර්ශණිකයන් 03 දෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ග්‍රීක ජන ජීවිතය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

(i)පොළොන්නරුව


(ii) කුරුණෑගල

(iii) දැදුරු ඔය

(iv) සීගිරිය

(v) මින්නේරි වැව

(vi) වාකිරිගල (ලකුණු 06 x 2 = 12)



# 7 ශ්‍රේණියේ අවසාන වාර පරීක්ෂණයේ පිළිතුරු පත්‍රය

## ඉතිහාසය

**I කොටස**

1. - (3)
2. - (3)
3. - (2)
4. - (1)
5. - (3)
6. - අකලහස
7. - විජය කුලංකෙ
8. - ජේසුතුමාගේ
9. - අම්බුලුගල
10. - කෝට්ටේ
11. ( X )
12. ( √ )
13. ( X )
14. ( √ )
15. ( X )
16. B
17. C
18. A
19. E
20. D

**II කොටස**

1. i)
   i. පොළොන්නරුව
   ii. I පරාක්‍රමබාහු රජු
   iii. පොළොන්නරු කථිකාවත කරවීම
   ගල් විහාරය , පොත්ගුල් විහාරය , පබලු වෙහෙර , කිරි වෙහෙර කරවීම.

   ii)
   i. දැව හෙප්පු
   ii. ලාක්ෂා
   iii. හැරමිටි , බස්තම් , වටාපත් මිටි , සේසත්

   iii)
   i. ඇතීනා
   ii. ග්‍රීක
   iii. ඇත්දත් , රන්

2.

i. උදැල්ල , කැත්ත , නගුල , පෝරුව , දැතිගස්
ii. නියරවල පොල්පිති හිටුවීම
   තෙල් පොගවන ලද පහන්තිර පත්තු කිරීම
iii.
   - ගිනිමැල ගැසීම.
   - දඩුවැට දැමීම.
   - පැල් රැකීම.

3.

i. ඉන්දියාව , චීනය , අරාබිය , රෝමය , පර්සියාව , අග්නිදිග ආසියාතික රටවල්
ii. * පිඟන්
   * සේද රෙදි
   * සුවඳ විලවුන්
   * අශ්වයින්
iii. පිටුව 12 විස්තරය අනුව පිළිතුරු තිබේ නම් ලකුණු ලබා දෙන්න

4.

i. A – කාංචිපුරය
   B – මදුරාපුරය
   C - තන්ජෝරය
ii.
   - කාලිංස කුමරියක විවාහ කර ගැනීම.
   - නැගණිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දීම.

iii. පිටුව 27 විස්තරය අනුව පිළිතුරු තිබේ නම් ලකුණු ලබා දෙන්න

5.

i. වෙසක් උත්සවය , ජල ක්‍රීඩා උත්සවය , වප් මගුල් උත්සවය

ii. දඹදෙණිය , යාපහුව , ගම්පොළ , කුරුණෑගල , කෝට්ටේ
iii. පිටුව 57 , 58 විස්තරය අනුව පිළිතුරු තිබේ නම් ලකුණු ලබා දෙන්න

6.


i. ඇරිස්ටෝටල් , සොක්‍රටීස් , ප්ලේටෝ
ii.

   - රෝම ලන්දේසි නීතිය.
   - කිතු දහම.

- ලතින් භාෂාව.
- රෝම ගෘහ නිර්මාණ ශිල්පය.

iii. පිටුව 64 , 65 විස්තරය අනුව පිළිතුරු තිබේ නම් ලකුණු ලබා දෙන්න

7.





LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
NEW SYLLABUS
2024
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න